## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියේ තනතුරුවලට පත් කිරීම

රාජ්‍ය නිලධාරීන් ඵලදායී සහ කාර්යක්ෂමව සේවයේ යෙදවීම සඳහා දීප ව්‍යාප්ත සේවාවල I ශ්‍රේණියේ තනතුරු සඳහා වඩාත් සුදුසු නිලධාරීන් එම ශ්‍රේණියේ නිලධාරීන් අතුරින් තෝරාගැනීම සඳහා සාධාරණ හා විනිවිදභාවයකින් යුත් ක්‍රියාපටිපාටියක් සකස් කිරීම උදෙසා පළ කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/2023 හි විධිවිධාන අනුව, 2024.12.31 දින දක්වා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියේ තනතුරුවල ඇති වන පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අංක 1670/32 හා 2010.09.10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අංක 2137/26 හා 2019.08.20 දිනැති හා අංක 2224/20 හා 2021.04.21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍ර මඟින් සිදු කරන ලද සංශෝධන හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 34/2019 ප්‍රකාරව ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියට උසස්වීම සඳහා සියලු සුදුසුකම් සම්පූර්ණකොට ඇති ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට සති දෙකකට ප්‍රථම, සත්‍ය වශයෙන්ම පවතින පුරප්පාඩු සංඛ්‍යාව සහ ආයතන, සහ 2024.12.31 දින තෙක් ඇති වන බවට පුරෝකථනය කරන ලද පුරප්පාඩු ලැයිස්තුව රාජ්‍ය පරිපාලන වෙබ් අඩවියේ පළ කරනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන නිලධාරීන් එකී තනතුරු සඳහා තම මනාපය ප්‍රකාශ කරන ලද ලේඛනය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට භාර දිය යුතුය.)

02. ඒ සඳහා වන ආදර්ශ අයදුම්පත ඇමුණුම I වශයෙන් පළ කරන අතර අදාළ සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මඟින් 2024.04.26 දිනට ප්‍රථම මා වෙත ලැබෙන පරිදි යොමු කළ යුතුය.

03. අදාළ සුදුසුකම් සම්පූර්ණ කර ඇති සියලුම නිලධාරීන් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/2023 හි සඳහන් සම්මුඛ පරීක්ෂණ මාර්ගෝපදේශවලට අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එහිදී පහත දක්වා ඇති නිර්ණායක යටතේ ලකුණු ලබා දෙනු ඇත. (වැඩිදුර විස්තර රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/2023 හි සඳහන් වේ)

| අනු අංකය | ක්ෂේත්‍රය | උපරිම ලකුණු |
|---|---|---|
| i. | කේන්ද්‍රීය/ ප්‍රධාන නිපුණතා | 500 |
| ii. | පළපුරුද්ද | 400 |
| iii. | භාෂා ප්‍රවීණතාව | 100 |
| | මුළු ලකුණු | 1000 |

04. එකී සම්මුඛ පරීක්ෂණයේදී ලබා දෙන ලකුණු අනුව සකස් කරනු ලබන කුසලතා ලේඛනයේ අනුපිළිවෙළ සහ නිලධාරීන්ගේ මනාපය සලකා බලා, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තෝරාගනු ලබන නිලධාරීන් පුරප්පාඩු පවතින තනතුරු සඳහා පූර්ණකාලීනව වැඩබැලීමේ පදනම මත පත් කරනු ඇත. රිට් අයදුම්පත් අංක 207/2020 සම්බන්ධයෙන් පවතින අධිකරණ ක්‍රියාමාර්ග අවසන් වන තෙක් ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියේ තනතුරුවලට පත්කිරීම් මෙම ක්‍රියාපටිපාටිය අනුව සිදු කරන අතර මෙම වැඩබැලීමේ පත්වීම ස්ථිර පත්වීම් බවට පරිවර්තනය කිරීම පිළිබඳව අධිකරණ ක්‍රියාමාර්ග අවසන් වූ පසුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කෙරෙනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,



ප්‍රදීප් යසරත්න

ලේකම්

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දිනය : 2024.03.21

ඇමුණුම I

**<u>ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියේ තනතුරුවලට පූර්ණකාලීනව වැඩබැලීමේ පදනමින් පත්කිරීම සඳහා වන අයදුම් පත්‍රය</u>**

**I කොටස - අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුය.**

1. අයදුම්කරුගේ පෞද්ගලික තොරතුරු

 i. සම්පූර්ණ නම :
 ii. ජාතික හැඳුනුම්පත් අංකය :
 iii. උපන් දිනය හා වයස :
 iv. පෞද්ගලික ලිපිනය :
 v. දුරකථන අංක :
 vi. විද්‍යුත් තැපැල් ලිපිනය :
 vii. සේවය කරන ශ්‍රේණිය :
 viii. ශ්‍රී ලං.ක්‍ර.සේ. III ශ්‍රේණියට පත් වූ දිනය :
 ix. ශ්‍රී ලං.ක්‍ර.සේ. II ශ්‍රේණියට උසස් වූ දිනය :
 x. තනතුර :
 xi. දැනට දරන තනතුරට පත් වූ දිනය :
 xii. අමාත්‍යාංශය :
 xiii. දෙපාර්තමේන්තුව :
 xiv. අනෙකුත් තොරතුරු (අවශ්‍ය අනෙකුත් තොරතුරු පවතියි නම් ඇතුළත් කළ හැකිය)

2. සේවා විස්තර

 i. ලබා ඇති වැටුප් රහිත / අඩ වැටුප් නිවාඩු

| අනු අංකය | නිවාඩු පටන් ගන්නා දිනය | නිවාඩු අවසන් වන දිනය | සම්පූර්ණ කාලය (අවු. මාස දින) | අරමුණ | නිවාඩු ලබා දීමට පදනම් වූ ආයතන සංග්‍රහයේ විධිවිධානය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |

ii. විනය ක්‍රියාමාර්ග ගෙන ඇත්නම්

| චෝදනා පත්‍රයේ අංකය හා දිනය | විනය නියෝගය (තවම ලබා දී නොමැති නම් ඒ බවද සඳහන් කරන්න) | දඬුවම ක්‍රියාත්මක වන දිනය (විනය නියෝගය මඟින් දඬුවමක් ලබා දී ඇත්නම් පමණක්) | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිහි 236 වගන්තියේ I අනුව සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු කාලය | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිහි 236 වගන්තියේ II අනුව ශ්‍රේණි උසස්වීමට නුසුදුසු වන කාලය අවසන් වන දිනය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

iii. පළපුරුද්ද

පත්වීම් දින සිට මේ දක්වා සේවය කළ සේවා ස්ථාන (රාජකාරී භාරගත් ලිපිවල සහතික කළ පිටපත් ඇමිණිය යුතුය)

| තනතුර | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ කොමිෂන් සභාව/ ආයතනය | කාලසීමාව | | රාජකාරී ස්වභාවය සහ වගකීම් පිළිබඳ කෙටි විස්තරය |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

3. I ශ්‍රේණියේ තනතුරකට පත්වීමට අදාළ සුදුසුකම්

i. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ

| කාර්යක්ෂමතා කඩඉම | සම්පූර්ණ කළ යුතු දිනය | සම්පූර්ණ කර ඇති දිනය | සහන කාල අනුමත කර ඇත්නම් හෝ නිදහස් කර ඇත්නම් ඒ පිළිබඳ විස්තර |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

ii. අයදුම්පත් කැඳවනු ලබන දිනට පෙරාතුව වූ වසර 06ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබේද යන්න

| වසර | කාර්යසාධන ඇගයීම (අසතුටුදායක/ සතුටුදායක/ සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ/ විශිෂ්ඨ) |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |

iii. අයදුම්පත් කැඳවනු ලබන දිනට II ශ්‍රේණියේ වැටුප් වර්ධක 06ක් උපයාගෙන තිබේද යන්න (රා.ප.ච. 34/2019 හි 2.2 ප්‍රකාරව උසස්වීම් ලැබීමට සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන් II ශ්‍රේණියේ වැටුප් වර්ධක 02ක් ලබා ගැනීම පිළිබඳ විස්තර ඇතුළත් කිරීම ප්‍රමාණවත් වේ)

| වසර | වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |

iv. පශ්චාත් උපාධි සුදුසුකම ලබා ගැනීමට අදාළ විස්තර (පශ්චාත් උපාධි සහතිකයන්හි සහතික කළ පිටපත් ඉදිරිපත් කළ යුතුය.)

| පශ්චාත් උපාධිය | ආයතනය | කාලසීමාව | වලංගුවන දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

.................................................                .....................................................

දිනය                                                 අයදුම්කරුගේ අත්සන හා නිලමුද්‍රාව

**II කොටස - ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුය.**

1. අයදුම්කරු විසින් ඉහත 03 යටතේ සඳහන් කර ඇති තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවත් අයදුම්කරු සේවයේ II ශ්‍රේණියේ වසර 06ක (රා.ප.ච. 34/2019 හි 2.2 ප්‍රකාරව උසස්වීම් ලැබීමට සුදුසුකම් සම්පූර්ණ කරන්නේ නම් වසර 02ක) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති/ නැති බවත්* රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා ඇති/ නැති* බවත් අයදුම්කරුට විරුද්ධව විනයානුකූලව ක්‍රියාමාර්ග ගෙන ඇති/නැති* බවත්, විනයානුකූලව කටයුතු කිරීමට අදහසක් ඇති/නැති* බවත් ඔහු/ඇය* අයදුම්පත් කැඳවන දිනට I ශ්‍රේණියට උසස්වීමට අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇති/නැති* බවත් සහතික කරමි.

විනයානුකූල ක්‍රියාමාර්ග ගෙන හෝ එසේ ගැනීමට අදහස් කරන්නේ නම් විස්තර සඳහන් කරන්න : ...............................................................................................................................................

...............................................................................................................................................

2. අයදුම්කරු විසින් ඉහත සඳහන් කර ඇති සියලු කරුණු අදාළ ලිපිලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිවැරදි බවට සහතික කරමි. තවද, ඉල්ලුම් කරන තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය* මෙම ආයතනයේ සේවයෙන් අනුප්‍රාප්තිකයෙකු සහිතව/ රහිතව* නිදහස් කළ හැකි/ නොහැකි* බවද මින් ප්‍රකාශ කරමි.

3. අයදුම්කරුගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වන/ සතුටුදායක නොවන* බැවින් පුරප්පාඩුව පවතින ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියේ තනතුරකට මෙම අයදුම්කරු පත් කිරීම නිර්දේශ කරමි./ නිර්දේශ නොකරමි.*

නිර්දේශ නොකරන්නේ නම් හේතුව කෙටියෙන්: ..........................................................................................

................................ ................................................................
දිනය ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

**III කොටස - අදාළ අමාත්‍යාංශ ලේකම් විසින් සම්පූර්ණ කළ යුතුය.**

................................................................. මහතා/ මහත්මිය/ මෙනවියගේ* අයදුම්පත්‍රය නිර්දේශ කරන/ නොකරන* අතර ඉහත II කොටසේ ආයතන ප්‍රධානියාගේ ප්‍රකාශයන් හා එකඟ වෙමි/ එකඟ නොවෙමි.*

............................. ....................................................................
දිනය අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන හා නිල මුද්‍රාව

*අනවශ්‍ය වචන කපා හරින්න